**ශීර්ෂය 276 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්වාගණනය කල මතය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 31 වන දින ගණන් දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අප්‍රේල් 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**1.2** මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන් දිමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍යා වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදි එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවති.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදි වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දිමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **මූල්‍ය නොවන වත්කම්**<br><br>භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය 82 හා ACA 6 ආකෘතිය අනුව දේපල පිරියත හා උපකරණ එකතුව රු.2,655,070,783 ක් වුවද, එය ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ රු.83,682,068 ක් ලෙස දැක්වීමෙන් රු.2,571,388,715 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරය විසින් අයිතම කිහිපයක් යටතේ සිදු කරන ලද වෙනස් කිරීම් මෙම වෙනසට හේතු වී තිබුණි. | දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය සමඟ සසඳා නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තැන්පත් ගිණුම් 05 කට අදාලව රු.11,306,447 ක්වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද රු.5,451,894 තැන්පතු 04 ක ශේෂයන් වර්ෂ 2 – 10 අතර කාලයක් තුලද, රු.5,854,553 ක් වූ තැන්පතු 01 ක ශේෂය වර්ෂ 10 කට වැඩි කාලයක් තුලද තැන්පතු ගිණුමේ පැවතී තිබුණි. | ඇප තැන්පත් වශයෙන් තබාගත් තැන්පතු නිදහස් කිරීම සඳහා ගිවිසුම්ගත කාලය අවසන් වී නොමැති අතර ඇතැම් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල බව දන්වමි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් වශයෙන් දැක්විය යුතු රු.15,499,239 ක ප්‍රාග්ධන වියදම් සහ රු.291,925 ක හැකියා වර්ධන වියදම්, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙන් වශයෙන් දැක්වීමට ස්ථානයක් නොමැති බැවින් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වූ බව. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව වර්ගීකරණය කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |

(ඇ) නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය<br>නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 137(5) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව වවුචර් වල සඳහන් භාණ්ඩ කාර්යාල වෙත ලැබී නොතිබියදී 2021දෙසැම්බර් 31 දින ලියන ලද රු.2,356,627 ක් වටිනා චෙක්පත් 12 ක් 2022 ජනවාරි 31 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. | සැපයීම් භාරගෙන නොතිබුණ ද රජයේ රෙගුලාසි හා උපදෙස් අනුව ද්‍රව්‍ය පිලිබඳ ගණන් පෙන්වා ඇත. | භාණ්ඩ ගබඩාවට භාර ගැනීමෙන් පසු ගෙවීම් කල යුතු අතර හැකිතාක් ඉක්මනින් චෙක්පත් ආදායකයින් වෙත භාරදිය යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2) | යම් නිශ්චිත කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිම එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිව් දෙනෙකුට හා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිව් දෙනෙකු වෙත අවස්ථා 13 කදී දෙන ලද අතුරු අග්‍රිම පියවීමේදී දින 05 සිට දින 57 දක්වා ප්‍රමාදයක් පැවතිනි. | දෙන ලද අග්‍රිම පියවීම ප්‍රමාද නොකරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | අදාල කාර්යය නිම වූ වහාම අග්‍රිම පියවිය යුතුය. |

(ආ)

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2006 නොවැම්බර් 29 දිනැති අංක ABK/N/1/2/22 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් විසින් කොට්ඨාශයේ හෙලන ලද කොස්ගස් 28 ක් පිළිබඳව 2020 හා 2021 වර්ෂ වලට අදාල සාරාංශ ගත වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | මාසික වාර්තා ඉදිරිපත් කරන ලෙස ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර වාර්තා පිළියෙල කල යුතුය. |
| (ii) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | විශ්‍රාමියෙකු මියගිය පසු දින 07 ක් තුල ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් මිය ගිය විශ්‍රාමිකයින් 16 දෙදෙනෙකු සඳහා රු. 404,415 ක් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන දිනයට පසුව සිදු කෙරෙන වෙනස්කම් සිදු කිරීමට නොහැකි බවත් හා සිදුවන ප්‍රමාද වීම් වැලැක්විය නොහැකි බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණි හා පිටවූ වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගැනීමකින් තොරව 2021 වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ලෙස රු.2,540,388 ක් ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ ලේඛණයක් පවත්වා ගැනීම පමණක් ප්‍රමාණවත් බව දන්වා ඇත. | ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සඳහන් වේලාවන් පදනම් කර ගනිමින් චක්‍රලේඛය ප්‍රකාරව අතිකාල හා නිවාඩු දින වැටුප් ගණනය කර ගෙවීම් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරවෙල දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය රු.6,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද එය උපයෝජනය කර නොතිබුණි. පිරිවැය රු.4,819,338 ක් වැය කර තිබුණු ගොඩනැගිල්ලේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවුවද එක් සැපයුම්කරුවෙක් වත් ඉදිරිපත් නොවූ බව දන්වමි. | කාල ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති නිමකල යුතුය. වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය කර මහජනතාවට ප්‍රතිලාභ සැලසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට රු.35,462,350 ක් නිදහස් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගත් උපකරණ 2022 පෙබරවාරි මාසය වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී නොතිබුණි. | බණ්ඩාරවෙල, සොරණාතොට, කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති වාර්තාව සඳහා 2021 ඔක්තෝබර් 12 දින අනුමැතිය ලබාදුන් බැවින් මිලදී ගැනීම් කටයුතු ප්‍රමාද වූ බව දන්වා ඇත. | ව්‍යාපෘති අදාල කාලය තුල නිමකර අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ රු.5,970,000 ක ප්‍රතිපාදන මත සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කල කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් මස ආරම්භ කර දෙසැම්බර් මස අවසානය වන විට නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.5,181,937 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණද 2022 පෙබරවාරි 10 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත කිසිදු උපකරණයක් ලබාදී නොතිබුණි. | කොම්පෝස්ට් නිෂපාදන යන්ත්‍ර නියමිත දිනට ලබාගැනීමට නොහැකි වූ බවත්, 2022 මැයි 23 දිනට යන්ත්‍ර 30 ක් බෙදා දී අවසන් බව හා ඉතිරි යන්ත්‍ර ඉදිරියේදී බෙදා දීමට කටයුතු කරමි. | එම |
| (ඇ) | ආපදා කලමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ස්වභාවික ආපදාවන්ගෙන් අවදානමට පත්වූ පිරිස් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය වන විට නැවත පදිංචි කල යුතු පවුල් 4149 න් තෝරාගත් පවුල් ඒකක 315 ක් සඳහා වෙන් කර තිබූ රු.310,693,494 ක ප්‍රතිපාදන වලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.240,552,513 ක් වැයකර තිබුණු ද පවුල් ඒකක 55 ක් පමණක් නැවත පදිංචි කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිපාදන උපයෝජනය කල යුතු අතර අවදානමට පත් පිරිස් එම ස්ථාන වලින් ඉවත් කර නැවත පදිංචි කිරීමට කටයුතු කල යුතුය. |

## 2.2 ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ පිළිබඳ දැනුවත් වී නොමැති අතර ඉදිරියේදී පනතේ විධිවිධාන අනුව කටයුතු කරන බව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ නියමයන්ට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.11 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | නව ගණකාධිකාරිවරු හා වැඩ බලන ගණකාධිකාරිවරුන් සිටීම නිසා පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදුවූ බව දන්වමි. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට අපේක්ෂිත වූ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල හා | ගොඩනැගිලි ද්‍රව්‍ය සපයා ගැනීම, කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීමට නොහැකි වීම නිසා ඔවුන් මුහුණදෙන මූල්‍ය ගැටළු හා කොවිඩ් වසංගතය හේතුවෙන් පැනවූ නිරෝධායන ඇඳිරිනීති | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර අදාල කාර්යය ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම යන ක්‍රියාකාරකම් ඉටුකර ගෙන නොතිබුණි. | තත්ත්වයන් මත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. | |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.594,174 ක් වැය කරමින් 2017 දෙසැම්බර් 19 දින වැඩ අවසන් කර තිබුණු ශාන්ත තෝමස් විද්‍යාලයේ පැති විකට්ටුව 2022 මැයි 31 දින වන විටද භාවිතයට ගත නොහැකිව පැවතිනි. | රාජ්‍ය ආදායමට බැරකර ඇති රඳවුම් මුදල් ලබා ගෙන භාවිතයට ගතහැකි පරිදි සකස් කර ගන්නා බව දන්වමි. | ව්‍යාපෘතිය නිම කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 ගම්පෙරලිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කිරිවැල්කැටිය සිට ගිගිරිපුදාම දක්වා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 ජූලි 22 දින සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් සමඟ රු.993,398 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.966,336 ක් වැය කර තිබුණු අතර 2022 පෙබරවාරි 24 දින භෞතික පරීක්ෂාවේදී ඇස්තමේන්තුවේ සඳහන් ඉටු නොකල වැඩ විෂයයන් 03 ක් සඳහා රු.45,663 ක් ගෙවා තිබුණි.<br><br>5000 L ප්‍රමාණයේ ප්ලාස්ටික් ජල ටැංකිය සඳහා රු.2,574 ක් වැයකර තිබූ gate value සවිකර නොතිබුණු අතර වතුර මෝටරය හඳුනාගත හැකි කාණ්ඩ අංකය මකා දමා තිබුණි. රු.116,400 ක් වැයකර මිලදී ගෙන සවිකර තිබූ වතුර මෝටරය අක්‍රියව පැවති බැවින් ප්‍රතිලාභී පවුල් වෙත පානීය ජලය ලබාදී නොතිබුණි. ව්‍යාපෘතියේ අවසන් බිල්පත් ගෙවීමේදී මැණුම්පතේ සඳහන් ප්‍රමාණයට වඩා රු.12,941 ක් ගෙවා තිබුණි. | සවිකර තිබූ Box bar සොරුන් විසින් ගලවා ගෙන ගොස් ඇති බවත්, වතුර මෝටරයේ පිරිවිතර තහවුරු කරගැනීම සඳහා මිලදී ගැනීම් කල ආයතනය වෙතින් ඉල්ලීමක් කල බව හා වැඩිපුර ගෙවන ලද මුදල රඳවුම් මුදලින් අඩු කර ගන්නා බව. | ව්‍යාපෘතිය නිම කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ගම්පෙරලිය කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,224,750 ක් වැය කර ට්‍රැක් 02 නිවාස අසලින් වෙළඔය හරහා පාලමක් ඉදි කර තිබුණු අතර සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා මත පැවති අධික වර්ෂාවෙන් පාලමට හා කොන්ක්‍රීට් මාර්ගයට භෞතිකව හානි සිදු වී තිබුණි. | වැව් ඉවුරේ හා දකුණු ඉවුරේ පැතිබැම් නොමැති වීම නිසා ජලමාර්ග අවහිර වීමෙන් පොළොව ඛාදනයට ලක්වී කොන්ක්‍රීට් තට්ටුව පුපුරා ගොස් ඇති බව. | ව්‍යාපෘතීන් නිසි පරිදි සැලසුම් කර නිමකල යුතුය. |
| (ඈ) | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රු.35,605,877 ක ප්‍රතිපාදන මත බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් යටතේ ක්‍රියාත්මක කළ සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩ සටහන යටතේ 2021 දෙසැම්බර් 31 දිනට රු.21,545,879 ක් වැය කර තිබුණද අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබාගෙන නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය නිසා උපකරණ ලබා ගැනීම ප්‍රමාද විය. | ව්‍යාපෘති ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කල යුතුය. |

3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.982,560 ක ගිවිසුම්ගත මුදලකට නකහඩිය ක්‍රීඩා සමාජයේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය 2014 වර්ෂයේදී වැඩ අවසන් කර තිබුණද 2022 ජනවාරි 13 දින වන විටත් භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතිණි. | ක්‍රීඩාපිටිය ක්‍රීඩා කටයුතු සඳහා විවෘත කර ප්‍රාදේශීය සභාව වෙත විධිමත් පරිදි භාරදීමට කටයුතු කරමි. | ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කල යුතුය. |

3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ හින්දු කෝවිල් 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.600,000 ක් සහ හින්දු කෝවිල් 02 ක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.180,000 ක් ලෙස රු.780,000 ක් 2021 අගෝස්තු 12 දින හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබාදී තිබුණ ද 2022 මැයි 23 දින වන විටත් කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි. | හින්දු කෝවිල් වලින් අවශ්‍යතාව දැන්වීමේ ලිපි ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බැවින් ඇස්තමේන්තු සකස් කිරීමට නොහැකි විය. | ප්‍රතිපාදන උපයෝජනය කර වර්ෂය තුල ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අධියර දෙකක් යටතේ බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ රු.4,000,000 ක ප්‍රතිපාදන මත කඳන ප්‍රදේශයේ ක්‍රියාත්මක කල සංස්කෘතික සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉපැරණි කර්මාන්ත ශිල්ප කලා ගම්මානය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඌව කඳන වැඩිහිටි සන්ධානය වෙත රු.3,231,920 ක් ගෙවා තිබුණි. 2021 නොවැම්බර් 30 දින වන විට එහි වැඩ නිමකල යුතු වුවද 2022 මැයි 23 දින වන විටත් ව්‍යාපෘතියේ කුඹල් ගෙදර, ධීවර ගෙදර, වැව, වැදි ගෙදර, පතල් වාඩිය , ගමේ කඩේ යන ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | 2022 මැයි 23 වන විට ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර ඇත. | ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කර ප්‍රතිලාභ අත් කරගත යුතුය. |
| (ඇ) | මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.140,961,320 ක ගිවිසුම්ගත මුදලකට 2017 දෙසැම්බර් 18 දින Finite Lanka ආයතනය සමග ගිවිසුම්ගතව තිබුණු අතර 2022 මාර්තු 15 වන විට රු.109,020,394 ක් වැය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව | රටතුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා පැනවූ නිරෝධායන ඇඳිරි නීතිය, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟතාවය, ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහන ගැටළු බලපා ඇත. | එම |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුම්ගත දින සිට දින 546 කින් වැඩ අවසන් කල යුතු වුවද විගණිත දිනය වූ 2022 මාර්තු මස 15 වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. එදිනට වැඩ ප්‍රමාද කාලය දින 1547 ක් වූ අතර එය ඇස්තමේන්තු ගත කාලය මෙන් තුන් ගුණයකට ආසන්න වී තිබුණි. | | |
| (ඇ) | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ රු.6,000,000 ක ප්‍රතිපාදන මත ඇස්තමේන්තුගත පිරිවැය රු.5,636,026 ක් වූ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 4"– 6" දක්වා වූ මුක්කු වට ලී මිලදී ගෙන තිබුණි. 2021 දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව මීටරයක මිල රු.100 ක් වුවද මීටරයක් සඳහා සැපයුම්කරුගේ මිල රු.520 ක් ලෙස දික් අඩි 1665 ක් සඳහා රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකල යුතු වුවත් 2022 ජනවාරි 24 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. නියමිත කාලරාමුවකට අනුව ප්‍රසම්පාදන කටයුතු, මිලදී ගැනීම් කටයුතු හා ඉදිකිරීම් කටයුතු නොකිරීම හේතුවෙන් ද්‍රව්‍ය ඇස්තමේන්තුවෙන් සියයට 55 ක ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා පමණක් රු.5,539,696 ක් වැය කර තිබුණි. සංවර්ධන කටයුතු සඳහා මිලදී ගන්නා ලද වැලි සහ මැටල් ඉදිකිරීම් ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියේ මිණුම් ලබා ගත හැකි වන සේ ගොඩ ගසා (filling) නොතිබුණු අතර මිලදී ගත් ප්‍රමාණයන්, වැඩ බිමට නිකුත් කල ප්‍රමාණයන් හා ශේෂයන් ලේඛනගත කර නොතිබුණි. දෛනික ද්‍රව්‍ය භාවිත හා ශේෂ වාර්තා පිළියෙල කර නොතිබුණු අතර සහතික කල නිම් වැඩ හා කෙරීගෙන යන වැඩ තක්සේරු කර වාර්තා කර නොතිබුණි. | ලංසුකරු සමඟ වාචිකව සාකච්ඡා කලද මිල ගණන් වෙනස් කල නොහැකි බව දන්වා ඇත. | ගෙවීම් සහතික කිරීමේදී රේටයන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කල යුතු අතර රජයේ බඩු බාහිරාදිය ලැබීම්, නිකුත් කිරීම් හා ගබඩා කිරීම් පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. නියමිත කාල සීමාව තුල ව්‍යාපෘති ඉදිකිරීම අවසන් කිරීමට කටයුතු කල යුතුය. |

3.5 දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.1,833,070 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබූ බණ්ඩාරවෙල මහ නගර සභා ක්‍රීඩාපිටිය අසල ඇවිදින මංතීරුව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දී, ඉටුකර ඇති බවට භෞතිකව හඳුනාගත නොහැකි අයිතම 02 ක් සඳහා රු.198,320 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය ඇවිදින මංතීරුවක් ලෙස භාවිතයට ගත හැකි පරිදි හඳුනාගත නොහැකි වූ අතර විවිධ ස්ථාන වල දෙදෙනෙකුට දෙපසට ගමන් කල නොහැකි පටු ස්ථාන පැවතුණි. | ඉදිකිරීමේ අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රඳවුම් මුදල් නිදහස් කල බව හා භූමියේ පිහිටීම අනුව ඇතැම් ස්ථානවලදී මංතීරුව පළල් කළ නොහැකි බව දන්වා ඇත. | ඇස්තමේන්තුවේ සඳහන් කාර්යන් ඵලදායීව ඉටුකර ඇතිබව තහවුරු කර ගැනීමෙන් පසුව ගෙවීම් කල යුතුය. |

3.6 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇල්ල ආරුක්කු නවය පාලම වෙත ලගාවෙන විකල්ප මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ලංසු ඇගයීමේදී රු.5,921,418 කු වූ අවම ලංසුව අදාල ලංසුකරු විසින් පෙර කොන්ත්‍රාත්වල පලපුරුද්ද , මූල්‍ය සම්පත්වල හැකියාව හා සුදුසුකම් ඇගයීමට ප්‍රමාණවත් ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව වූ රු.6,357,337 ක ලංසුව පිළිගෙන තිබුණි. අවම ලංසුව ඉදිරිපත් කල ලංසුකරුගේ පලපුරුද්ද, සුදුසුකම් එම ලංසුකරු සමඟ සාකච්ඡා කොට නැවත පරීක්ෂාව මගින් ප්‍රසම්පාදනයේදී වඩා වාසිදායක තත්ත්වයක් අස්ථිත්වයට ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සැලකිලිමත් නොවී දෙවන අවම ලංසුව තෝරාගැනීම හේතුවෙන් | අවම ලංසුව ඉදිරිපත් කල ලංසුකරු විසින් අවශ්‍ය ලිපිගොනු සියල්ල නිවැරදිව ඉදිරිපත් කර නොතිබූ නිසා අවම ලංසුව ප්‍රතික්ෂේප කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

රු.435,923 ක අලාභයක් සිදුවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) අනුව ප්‍රසම්පාදනය සිදුකිරීමේ අරමුණු ඉටු කරගෙන නොතිබුණි.

3.7 වත්කම් කලමනාකරණය

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නායයෑම් අවදානම් නොමැති බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් තහවුරු කල හා අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි බව දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සහතික කළ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පල්ලේපේරුව ග්‍රාම නිලධාරි නිල නිවාස අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර වර්ෂ 12 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | විධිමත් ඉංජිනේරු උපදෙස් යටතේ එම ස්ථානයේම නව ගොඩනැගිල්ලක් ඉදිකල හැකි බව හා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි. | රාජ්‍ය දේපල කාර්යක්ෂමව භාවිතා කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන සැලසිය යුතුය. |

3.8 නිශ්කාර්ය වත්කම්

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු යතුරු පැදි 03 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සතු යතුරු පැදියක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් සතු කැබ්රථ 02 ක් අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර වර්ෂ 05 සිට වර්ෂ 16 දක්වා වූ කාල පරාසයක සිට නිශ්ක්‍රීයව කාර්යාල පරිශ්‍රයන්හි රඳවා තිබුණි. | අපහරණයන් කිරීමට ප්‍රථම අයිතිය පවරාගෙන ඇතැම් වාහන අලුත්වැඩියා කල හැකි බවත්, ඇතැම් වාහන සඳහා විමර්ශන කටයුතු සිදුකෙරෙන බව හා ඇතැම් වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කල යුතුය. |

3.9 පාඩු හා හානි

---------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------------------------------- | ----------- |
| (අ) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දරන කැබ් රථයක් 2010 අගෝස්තු 25 දින අනතුරට පත් වී තිබුණු අතර තක්සේරු ගත අලාභය වූ රු.500,000 ක මුදල 2022 මාර්තු 21 වන විටද අයකරගෙන නොතිබුණු අතර වාහනය අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වර්ෂ 12 කට අධික කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | 2019 මැයි 15 දින තක්සේරු වාර්තාවක් ලබා ගත් බවත් අනතුරෙන් සිදුවූ අලාභ හානියට වගකිව යුතු රියදුරු සේවය හැරගොස් ඇති බවත් එම හානිය අයකර ගැනීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත. | අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කල යුතුය. තක්සේරු අලාභය වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2015 සැප්තැම්බර් 04 දින අනතුරට පත්ව තිබුණු අතර සිදු වූ රු.70,834 ක අලාභයෙන් රක්ෂණයේ දී ප්‍රතිපූරණය නොකල රු.64,459 ක් 2022 මාර්තු 21 දින වන විටද මුදල් රෙගුලාසි 104(3) අනුව පොත් වලින් කපාහැරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු සිදුවෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2010 නොවැම්බර් 03 දින අනතුරට පත්වීමෙන් සිදු වූ රු.1,400,000 ක අලාභය අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයට එරෙහිව පවරා තිබූ නඩුවේ තීන්දුව 2019 ඔක්තෝබර් 07 දින ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ අනුව කටයුතු කර රජයට සිදු වූ අලාභය අයකර ගැනීමට 2022 මාර්තු 24 වන විටද කටයුතු කර නොතිබුණි. | 2019 ඔක්තෝබර් 07 දින නඩු තීන්දුව ලද බවත්, ඒ සම්බන්ධ අභියාචනයක් යොමු කර ඇති අතර අභියාචනයෙන් පසු තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වා ඇත. | එම |

| | | | |
|---|---|---|---|
| (ඈ) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථයක් 2017 ජූලි 29 දින අනතුරට පත් වී තිබුණු අතර සිදු වූ රු.6,349,333 ක අලාභයෙන් රු.2,500,000 ක් රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණ කර තිබුණි. 2022 මාර්තු 24 දින වන විටද රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොකල රු.3,849,333 ක අලාභය අයකරගෙන නොතිබුණි. රක්ෂණ වන්දි මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | වාහන අලුත්වැඩියාව සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඇති අතර වාහන අමතර කොටස් මිලදී ගැනීමට නොමැති වීම හා ප්‍රතිපාදන නොමැති වීම නිසා අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇත. | එම |
| (ඉ) | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් 2017 අගෝස්තු 18 දින අනතුරට පත් වීමෙන් 2019 පෙබරවාරි 12 දින වන විට අළුත්වැඩියා කර තිබුණි. බිල්පත් වටිනාකම රු.3,057,331 ක් වී තිබුණු අතර රක්ෂණ මගින් ප්‍රතිපූර්ණ නොකල රු.126,095 ක මුදල ගෙවා වාහනය නිදහස් කර ගැනීමට කටයුතු නොකර 2022 මාර්තු 24 දින වන විටද වර්ෂ 03 ක පමණ කාලයක් අළුත්වැඩියා සිදුකල ගරාජයේ නිෂ්කාර්යව රඳවා තිබුණි. | ගෙවීමට ඇති ඉතිරි මුදල් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර ප්‍රතිපාදන ලබා නොදීම මත වාහනය නිදහස් කර ගැනීමට නොහැකි වී ඇත. | ගරාජයේ රඳවාගෙන ඇති වාහනය නිදහස් කරගෙන රජයේ කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කල යුතුය. |

3.10 අනාර්ථික ගනුදෙනු

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පරණගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩ සටහන යටතේ රු. 493,279 ක ගිවිසුම්ගත මුදලකට ස්වේච්ඡා සංවිධානයක් මගින් ඉටුකරවා ගත් කිරවනාගම ප්‍රධාන බස් මාර්ගයේ සිට වහුගාල තැන්න දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේදී ඉටු නොකල අයිතමයන් 02 ක් සඳහා රු. 15,445 ක් ගෙවීම් කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ඇස්තමේන්තුවේ සඳහන් කාර්යන් ඉටුකර ඇතිබව පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවීම් නිර්දේශ හා සහතික කිරීම කල යුතුය. |

3.11 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 29 දින සිට 2022 මාර්තු 22 දක්වා කාලය තුල නිකුත් කල විගණන විමසුම් 13 කට 2022 අප්‍රේල් 19 දින වන විටද පිළිතුරු සපයා නොතිබුණි. | ගණකාධිකාරිවරුන්ගේ පුරප්පාඩු පැවතීම, විගණන විමසුම් ගිණුම් පියවන කාලයේදී ඉදිරිපත් කිරීම වැනි කරුණු හේතුවෙන් පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

3.12 කලමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2020 අතර කාලය තුල ප්‍රතිලාභීන් 188 ක් වෙත අපේක්ෂා ණය වැඩ සටහන යටතේ ලබාදී තිබුණු ණය මුදලින් රු.1,513,454 ක් ද චක්‍රීය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 92 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් රු.354,939 ක්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි | මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොටසක් අයකර ගත් බවත් වැලිමඩ, හපුතලේ හා පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාලය තුල ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 අප්‍රේල් 27 දින සිට ජූනි 05 දින දක්වා කාලය තුල ඇති වූ අපදා තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ නිවාස වලට රු.10,000 දක්වා වන්දි ගෙවීම සඳහා 2021 ඔක්තෝබර් 28 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.130,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද එම කාල සීමාව තුල සිදු වූ නිවාස හානි 10 ක් සඳහා 2021 නොවැම්බර් 23 දින වන විටද වන්දි ගෙවා නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරන බව. | නියමිත කාලයේදී වන්දි ගෙවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් විවිධ ණය වැඩසටහන් යටතේ සමෘද්ධි ලාභීන් 4976 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු.219,692,070 ක් ණය ශේෂ කල් පසුවී තිබුණු අතර ණයලාභීන් 989 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු. 42,997,627 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි. මෙම හිඟ ණය අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ණය වාරික අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණු අතර සොරණාතොට, කන්දකැටිය, හාලිඇල, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ණය වාරික නියමිත කාලයේදී අයකර ගත යුතුය. |
| (ඈ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතුය. පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන රු.653,965 ක ණය ශේෂයන් 2020 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | ඌව පළාත් සභාව වෙත ණය ශේෂ නිරවුල් කරන ලෙස දන්වා තිබුණද වාරික වශයෙන් හෝ නිරවුල් කිරීමේ කටයුතු සිදුකර නොමැත. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරතව සිට විශ්‍රාම ලැබූ, වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයින් 03 දෙනෙකුගේ වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන රු.185,281 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්ති අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුපෙන් අයකිරීමට යොමුකර ඇති අතර ඇතැම් ණය ශේෂ වාරික වශයෙන් අයකරන බව දන්වා ඇත. | එම |

| | | | |
|---|---|---|---|
| (ඊ) | විවිධ ආයතන විසින් සිදු කර තිබුණු වැරදි හර කිරීම් සහ වැරදි බැර කිරීම් හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය යටතේ රු.81,550 ක ණය ශේෂ 02 ක්ද ගෙවිය යුතු ණය යටතේ රු.14,067 ක ණය ශේෂ 02 ක්ද අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබූ අතර එම වැරදි සටහන් හඳුනාගෙන මාසයක සිට වසර 05 ක් දක්වා කාල පරාසයක් ගතවී ඇතත් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැති අතර තොරතුරු ලද වහාම ඉදිරියේදී නිරවුල් කරමි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ග්‍රාමීය ජල සම්පාදනය, වාරි මාර්ග කටයුතු, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය හා අපනයන කෘෂිකර්ම කටයුතු යන තිරසර සංවර්ධන අරමුණු වලින් සියයට 20 සිට සියයට 57 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකරගෙන නොතිබුණි. | ගොඩනැගිලි ද්‍රව්‍ය වල හිඟතාව, රජයේ මුදල් ප්‍රවාහයේ ඇති වූ අසාමාන්‍ය ප්‍රමාදය නිසා කොන්ත්‍රාත්කරුවන්ට බිල්පත් ගෙවීමට නොහැකි වීම, වරින්වර පැනවූ ඇඳිරිනීති තත්ත්වයන් මත කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ ගමනාගමන කටයුතු හා ද්‍රව්‍ය ප්‍රවාහනය අඩාල වීම හේතු වී ඇති බව. | තිරසර සංවර්ධන අභිමතාර්ථ ප්‍රශස්ථ මට්ටමින් ඉටුකර ගැනීමට නිලධාරීන් කාර්යක්ෂමව මෙහෙයවිය යුතුය. |

**5. මානව සම්පත් කලමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 26 ක පුරප්පාඩු 191 ක් පැවතිණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පුරප්පාඩු හා අතිරික්ත තාවයකින් තොරව ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුය. |